ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2019.09.02 |
|---|---|---|---|---|---|

## ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) – 07-2019

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ
ගණන්දීමේ නිලධාරීන් වෙත,

### නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සහ එම වාහන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම

උක්ත කරුණ සම්බන්ධව රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය නිකුත් කර ඇති 2019.05.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 13/2008(V), අංක දරණ චක්‍රලේඛය හා බැඳේ.(එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

02. මෙම චක්‍රලේඛයේ අංක 02 (ආ) කොටස මඟින් දක්වා ඇති,සම්පූර්ණයෙන්ම විදුලි බලයෙන් ධාවනය කරන වාහන භාවිතා කරන,අනුයුක්ත කළ නිල වාහන හිමිකම ඇති නිලධරයන්ට පහත පරිදි මාසික දීමනාවක් ගෙවීමට අදාල කොටස පමණක් දකුණු පළාත් සභාවට අදාල කර ගැනීමට , 2019.06.20 දිනැතිව ගරු ආණ්ඩුකාරතුමා අනුමැතිය ලබා දී ඇත.

| නිලධර කාණ්ඩය | මාසික දීමනාව |
|---|---|
| අමාත්‍යාංශ ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් සහ දිස්ත්‍රික් ලේකම්/දිසාපති/පළාත් ප්‍රධාන ලේකම් | රු.16,000/- |
| අතිරේක ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් | රු.12,000/- |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධරයන් | රු.10,000/- |
| ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම් | රු.8,500/- |

03. ඉහත තනතුරු දකුණු පළාත් සභාවට අදාල කර ගැනීමේ දී පහත දැක්වෙන ආකාරයට අදාල කර ගත යුතුය.

| රේඛීය අමාත්‍යාංශයට අදාලව | දකුණු පළාත් සභාවට අදාලව |
|---|---|
| අමාත්‍යාංශ ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් සහ දිස්ත්‍රික් ලේකම්/දිසාපති/පළාත් ප්‍රධාන ලේකම් | දකුණු පළාත් ප්‍රධාන ලේකම් |
| අතිරේක ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් | පළාත් අමාත්‍යාංශ ලේකම්වරු/ පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු හෝ ඒ හා සමාන නිලධරයන් |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධරයන් | පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධරයන් |
| ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම් | පළාත් ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් |

04.ඒ අනුව ඉහත පරිදි දීමනා ගෙවීමේ දී ඉහත කොන්දේසි වලට යටත්ව ගෙවීම් සිදු කරන ලෙස ද මේ පිළිබඳව ඔබ යටතේ ඇති සියළු ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

**ආර්.සී.ද සොයිසා,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:- 1.ලේකම්, රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - දැ:ගැ:ස

2. සහකාර විගණකාධිපති- දකුණු පළාත - දැ:ගැ:ස

3. දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/මුදල්/සැලසුම්/ඉංජිනේරු සේවා) - දැ:ගැ:ස

4.දකුණු පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ:ගැ:ස

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 13/2008 (V)

මගේ අංකය : EST-6/05/TPR/1020

රාජ්‍ය පරිපාලන හා

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

නිදහස් චතුරස්‍රය

කොළඹ 07.

2019.05.31

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සහ එම වාහන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2008.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 හා එහි සංශෝධිත චක්‍රලේඛ කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. සම්පූර්ණයෙන් විදුලි බලයෙන් ධාවනය කරන වාහන භාවිතා කරනු ලබන, අනුයුක්ත කළ නිල වාහන හිමිකම ඇති නිලධරයන්ට ද මාසික දීමනාවක් ලබා දීමට හැකි වන පරිදි එහි 02 ඡේදය පහත පරිදි සංශෝධන කෙරේ.

02 (අ) පෙට්‍රල්/ ඩීසල් වාහන භාවිතා කරන, අනුයුක්ත කළ නිල වාහන හිමිකම ඇති නිලධරයන්ට පහත පරිදි මාසික ඉන්ධන දීමනාවක් ගෙවනු ලැබේ.

| හිමිකම් ලබන නිලධරයන් | මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය | ඉන්ධන සඳහා අනුමත උපරිම මාසික දීමනාව |
|---|---|---|
| අමාත්‍යාංශ ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් සහ දිස්ත්‍රික් ලේකම්/ දිසාපති/ පළාත් ප්‍රධාන ලේකම් | 225 | මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය X මාසයේ පළමු දිනට පවතින ඉන්ධන මිළ |
| අතිරේක ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් | 170 | |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධරයන් | 140 | |
| ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම් | 120 | |

(ආ) සම්පූර්ණයෙන්ම විදුලි බලයෙන් ධාවනය කරන වාහන භාවිතා කරන, අනුයුක්ත කළ නිල වාහන හිමිකම ඇති නිලධරයන්ට පහත පරිදි මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

| නිලධර කාණ්ඩය | මාසික දීමනාව (රු) |
|---|---|
| අමාත්‍යාංශ ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් සහ දිස්ත්‍රික් ලේකම්/ දිසාපති/පළාත් ප්‍රධාන ලේකම් | 16,000.00 |
| අතිරේක ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් | 12,000.00 |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධරයන් | 10,000.00 |
| ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම් | 8,500.00 |

03. මෙම සංශෝධන 2019.06.01 දින සිට ක්‍රියාත්මක වේ.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතුව නිකුත් කරනු ලැබේ.

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

" විශිෂ්ටතම රාජ්‍ය සේවයක් උදෙසා"

0/25

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
# ஆளுநர் செயலகம்
# GOVERNOR'S SECRETARIAT

**දකුණු පළාත, පහළ ඩික්සන් පාර, ගාල්ල**
தென் மாகாணம், கீழ் டிக்சன் வீதி, காலி.
Southern Province, Lower Dickson Road, Galle.

මගේ අංකය / எனது இல / My No. } G/SP/02/01/1-19 III වෙළුම

ඔබේ අංකය / உமது இல / Your No: }

දිනය / திகதி / Date } 2019/06/20

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

<u>නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සහ එම වාහන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම.</u>

උක්ත මැයෙන් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් **2019.05.31** දිනැතිව නිකුත් කර ඇති අංක **:13/2008 (V)** දරන චක්‍රලේඛය හා බැඳේ.

02. එකී චක්‍රලේඛයේ 02.(ආ) කොටස මගින් දක්වා ඇති පරිදි සම්පූර්ණයෙන්ම විදුලි බලයෙන් ධාවනය කරන වාහන භාවිතා කරන, අනුයුක්ත කළ නිල වාහන හිමිකම ඇති නිලධරයන්ට පහත පරිදි <u>මාසික දීමනාවක් ගෙවීමට අදාළ කොටස පමණක් දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට</u> **2019.06.20** දිනැතිව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව කාරුණිකව දන්වමි.

| නිලධර කාණ්ඩය | මාසික දීමනාව (රු) |
|---|---|
| අමාත්‍යාංශ ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් සහ දිස්ත්‍රික් ලේකම්/දිසාපති/පළාත් ප්‍රධාන ලේකම් | **16,000.00** |
| අතිරේක ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන් | **12,000.00** |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධරයන් | **10,000.00** |
| ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම් | **8500.00** |

ඒ.යූ.වේලාරත්න
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

පිටපත : **G/SP/01/2** විෂයය

716

ආණ්ඩුකාර ලේකම්/ Governor's Secretary -Tp/Fax 091 2222498
සහකාර ලේකම්/ Assistant Secretary -Tp 091 2226990
නීති නිලධාරී/ Legal Officer -Tp 091 3097160
පරිපාලන නිලධාරී/Administrative Officer -Tp/Fax 091 2234480
විද්‍යුත් තැපෑල/ E-mail - governsecspc@sltnet.lk
වෙබ් අඩවිය/ Web site - governer.sp.gov.lk